## WEATHER FORECAST FOR 06th OCTOBER 2018
**(Issued at 05.30 a.m. on 06th October 2018)**

**Prevailing showery condition is expected to enhance over the island during today and tomorrow.**

Showers or thundershowers will occur in the most parts of the island after 2.00 p.m.
Heavy falls above 100 mm can be expected at some places in the North-western, Central, North-Central, Uva and Sabaragamuwa provinces and in Mannar, Vauniya district.
Showers or thundershowers may occur in western and southern coastal areas in the morning too.

Misty conditions can be expected at some places in the inland areas of the Western province and in Sabaragamuwa and Central provinces during the morning.

**There may be temporary localized strong winds during thundershowers. General public is kindly requested to take adequate precautions to minimize damages caused by lightning activity.**

**දිවයිනේ පවතින වැසි තත්ත්වය අද සහ හෙට දිනයන්හිදී තවදුරටත් වර්ධනය වේයැයි බලාපොරොත්තුවේ.**

දිවයිනනේ බොහෝ ප්‍රදේශවල සවස 2.00න් පමණ පසුව වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

වයඹ, මධ්‍යම, උතුරු-මැද, ඌව සහ සබරගමුව පළාත්වලත් මන්නාරම, වවුනියා දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථානවලට මි.මී. 100 ට වැඩි තද වැසි ඇති විය හැක.
බස්නාහිර සහ දකුණු වෙරළබඩ ප්‍රදේශවල තැනින් තැන උදෑසන කාලයේදීත් වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක.

බස්නාහිර පළාතේ අභ්‍යන්තර ප්‍රදේශවල සහ සබරගමුව සහ මධ්‍යම පළාත්වල සමහර ප්‍රදේශවල උදය කාලයේදී මීදුම් සහිත තත්ත්වයක් බලාපොරොත්තු විය හැක.

**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැක. අකුණු මගින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS (Issued at 05.30 a.m. on 06th October 2018)

**There is a low possibility in the sea areas extending from Kalutara to Pottuvil via Galle and Hambantota may experience sea surges until the evening of 07th October 2018, due to the effect of swell waves, having 2.0-2.5 m height (This is not for land area.)**

Showers or thundershowers will occur at several places in sea areas around the island.
Heavy showers or thundershowers can be expected at sea areas off the coast extending from Kankasanturai to Matara via Puttalam, Colombo and Galle.
Winds will be south-westerly in direction and wind speed will be 30-40 kmph in the sea areas extending from Bentota to Pottuvil via Galle and Hambantota. This sea area can be fairly rough at times as the wind speed can increase up to 50 kmph at times.
Winds will be variable in direction in the sea areas around the island and wind speed will be 15-25 kmph.

**Temporarily strong gusty winds and rough seas can be expected during thundershowers.**

## ඉදිරි පැය 24 සඳහා දිවයින වටා ඇති මුහුදේ කාලගුණ තත්ත්වය 2018 ඔක්තෝබර් මස 06 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදී.

**කළුතර සිට ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල ඔක්තෝබර් මස 7 වනදා සවස දක්වා මුහුදු රළ මීටර් 2.0-2.5 ක් පමණ දක්වා (මෙය ගොඩබිමට එන රළ උස නොවේ) ඉහළ යාමේ හැකියාවක් පවතින අතර සුළු වශයෙන් ගොඩබිමට පැමිණිය හැක.**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.
කන්කසන්තුරේ සිට පුත්තලම, කොළඹ සහ ගාල්ල හරහා මාතර දක්වා වන මුහුදු ප්‍රදේශවල තද වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක.

බෙන්තොට සිට ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළං නිරිත දෙසින් හමන අතර සුළගේ වේගය පැ.කි.මී. 30-40 පමණ වේ. එම මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී.50 දක්වා වැඩිවීමේ හැකියාවක් පවතින අතර විටින් විට තරමක් රළු විය හැක.
දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල සුළං නිශ්චිත දිශාවකින් තොරව හමන අතර සුළගේ වේගය පැ.කි.මී. 15-25 පමණ වේ.

**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව රළු විය හැක.**

කාලගුණ විද්‍යාඥ (Duty Meteorologist),
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology)

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2018/10/06
Time : 0542 hrs
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE